පන්නල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 10 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජූලි 02 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පන්නල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව දේශීය ණය හා සංවර්ධන අරමුදල සඳහා ගෙවිය යුතු පොලී රු.23,180 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවියයුතු පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට දායකය වූ රු.197,556 හා මරණ පාරිතෝෂිත සඳහා වූ රු.13,947 ක් සමාලෝචිත වර්ෂයට අදාල වියදම ලෙස ආදායම් හා වියදම් ගිණුමට ගෙන නොතිබූ අතර, වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ප්‍රමාණය රු.909,562 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානය වන විට මාකදුර සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.32,988,511 ක් වැයකර තිබුණද, අදාල ගොඩනැගිලි පිරිවැය, ගොඩනැගිලි ගිණුමට සටහන් කර නොතිබුණි.

(ඈ). 2009 වර්ෂයේ පැන නැගී තිබූ දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමේ ශේෂය හා දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය අතර වූ වෙනස නිවැරදි කර ගැනිම සඳහා රු.626,023 ක් දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුම හර කර සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් බැර කර තිබුණි. සභාව විසින් පවත්වාගෙන යනු ලබන දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය ලේඛණයේ ණය ශේෂයන් ක්‍රමවත්ව සටහන් කර නොතිබුණි. බැංකුව මගින් ණය වාරික ගෙවන මාර්ග තලනය මිලදී ගැනීම සඳහා ලබාගෙන තිබූ රු.3,000,000 ක ණය මුදලේ වාරික ගෙවීම පොලී ගෙවීම පිළිබඳ විස්තර ලේඛණයේ සටහන් කර නොතිබූ අතර ඊට අදාළ වාර්තා බැංකුවෙන් ලබාගෙන ගොනු ගත කිරීමක්ද සිදුකර නොතිබුණි. එනිසා ණය ශේෂ අතර වූ වෙනස සමුච්චිත අරමුදලට ගැලපීම ඊට හේතු සොයා බැලීමකින් තොරව ජනල් අංක 05 මගින් ඉහත පරිදි ගැලපීම් කර තිබුණි.

(ඉ). රැඳවුම් බදු මුදල් ලෙස සමාලෝචිත වර්ෂය තුල රු.422,365 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර තිබුණද ඒවා රැඳවුම් බදු මුදල් ගිණුමක් මගින් ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 14 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.473,834,073 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.388,244,478 ක් විය.

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම්වල හර ශේෂ එකතුව රු.37,167,993 ක් විය.

1.3.4 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.16,919,078 ක් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදරිපත් නොකිරීම නිසා එකතුව රු.152,232,983 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 <u>අනුකූල නොවීම්</u>

පහත දැක්වෙන නීති, රීති රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

වයඹ පළාතේ ක්‍රියාත්මක ඉඩම් කට්ටිකර විකිණීමට අදාල අතුරු ව්‍යවස්ථාව අනුව පොල් ඉඩම් කට්ටි කිරීමේදී පොල් වගා කිරීමේ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් සභාව විසින් කට්ටි සැලසුම් අනුමත කර තිබූ අක්කර 20 ක් පමණ වූ පොල් ඉඩම් 6 කට අදාලව එලෙස අනුමැතිය ලබාගෙන ඇති බවක් අනාවරණය නොවුණි.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.10,882,295 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.36,317,152 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

පහත සඳහන් මූල්‍ය පාලන ඌණතා /අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). වසර ගණනාවක් තුල ශේෂයක් ලෙස පැවති හිඟහිටි මූලධන ආධාර මුදල වූ රු.18,708,947 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ). සභාවේ බැංකු ගිණුමකට අදාලව බැංකු සැසඳුම් වල 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති හඳුනා නොගත් රු.28,465 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ඇ). විවිධ තැන්පතු යටතේ 2001 සිට 2008 කාල පරිච්ඡේදයට අදාලව පැවති රු.656,234 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කර නොතිබූ අතර අවස්ථා 17 ක් යටතේ 2006 වර්ෂයේදී ලබාදි තිබූ රු.119,374 ක අත්තිකාරම් ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඈ) බැංකු ගිණුමකට අදාලව නිකුත් කල නමුත් මාස 06 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 15,142 ක් වටිනා චෙක්පත් 7 ක් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 4,287 | 6,371 | 2,083 | 4,347 | 4,612 | 264 |
| (ii) | බදුකුලී | 15,171 | 12,517 | 2,654 | 14,498 | 20,780 | 6,281 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,506 | 1,215 | 2,291 | 3,226 | 3,153 | 73 |
| (iv) | වෙනත් ආදායම් | 59,066 | 50,493 | 8,573 | 69,042 | 53,547 | 15,495 |
| | එකතුව | 82,030 | 70,596 | 15,601 | 91,113 | 82,092 | 22,113 |

2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකල රු.16,529,058 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.20,239,036 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3.4 වරිපනම් බදු හා අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ අගෝස්තු වන විට හිඟ වරිපනම් බදු මුදල රු.2,196,887 ක්ද හිඟ අක්කර බදු ප්‍රමාණය රු.570,441 ක් වූ අතර මෙකී හිඟයන් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 158 හා 159 වගන්ති සහ 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ 143 හි දක්වා ඇති පරිදි හා රීති අංක 33 - 41 පරිදි කටයුතු කර ඇති බවක් තහවුරු නොවුණි.

2.3.5 කඩ කාමර බදු

සභාවට අයත් වැටකෙයාව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වලට අදාල එකවර ගෙවන මුදල් 2005 ජූලි වන විට ගෙවා අවසන් විය යුතු වුවත්, ඉන් කඩ කාමර 3 කට අදාලව රු.455,330 ක එකවර ගෙවන මුදලක් හිඟව පැවතුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරණ චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර කුලී යටත් පිරිසෙන් පස් වසරකට වරක් වත් සංශෝධනය කළයුතු වුවත්, සභාව සතු වැටකෙයාව හා පන්නල පොදු වෙළඳපල කඩ කාමර 36 ක 2003 හා 2004 තක්සේරු ගත කුලියම සමාලෝචිත වර්ෂය දක්වාම අයකර තිබුණි.

2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත<br>රු. 000 | තථ්‍ය<br>රු. 000 | විචලනය<br>රු. 000 | අයවැයගත<br>රු. 000 | තථ්‍ය<br>රු. 000 | විචලනය<br>රු. 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 35,481 | 28,321 | 7,160 | 41,799 | 26,984 | 14,815 |
| අනෙකුත් | 34,168 | 31,394 | 2,774 | 31,202 | 18,791 | 12,411 |
| උප එකතුව | 69,649 | 59,715 | 9,934 | 73,001 | 45,775 | 27,226 |
| ප්‍රාග්ධන වියදම | 91,395 | 70,996 | 20,399 | 147,933 | 88,415 | 59,518 |
| මුළු එකතුව | 161,044 | 130,711 | 30,333 | 220,934 | 134,190 | 86,744 |

2.5 මානව සම්පත් කළමණාකරණය

2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | - |
| ද්විතීයික | 25 | 22 |
| ප්‍රාථමික | 84 | 67 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | - |

2.5.2 සේවක මණ්ඩල කළමනාකරණය

සභාව විසින් ක්‍රියාත්මක කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ආදේශක කම්කරුවන් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණද ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.149,958,370 ක් වූ අතර, එයින් කාල විශ්ලේෂණ ඉදිරිපත් කර තිබුනේ වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන පෙර ගෙවුම් රු.200,000 ක් සඳහා පමණි.

2.6.2 <u>අයවීමට ඇති සේවක ණය</u>

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.209,944 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුවද රු209,944 ක් විය.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිස පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 3,925,512 ක්ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 16,462 බැගත් එකී අරමුදල විසින් අය කර පැවතියද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් වී නොතිබුණි.

2.8 <u>කාර්ය සාධනය</u>

(අ). අයවැය ලේඛණය මගින් සමාලෝචිත වර්ෂයේ ඉටුකිරීමට සැලසුම් කර තිබු රු.365,000 ක් වූ සුභ සාධන ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර එවැනි ව්‍යාපෘති 5 ක් වෙනුවෙන් වෙන් කර තිබූ රු.1,750,000 ක මුදල අදාල කාර්යටම නොයොදා වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි.

(ආ). අයවැය ලේඛණය මගින් සමාලෝචිත වර්ෂයේ ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.5,050,000 ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති 6 ක් ක්‍රියාත්මක කර නොතිබු අතර, එවැනි ව්‍යාපෘති 3 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු.6,300,000 ක මුදල අදාල කාර්යයට නොයොදා වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුල අයවැය ලේඛනයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වෙන්කර තිබූ රු.2,350,000 ක මුදලින් අයවැය ගත පිරිවැය රු.900,000 ක් වූ ගිරිඋල්ල පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම හැර ඉතිරි ව්‍යාපෘති 4 සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

2.9 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

---

03. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය